## ඉන්දියානු ධීවරයින්ට වෙඩි තබන ලද්දේ යැයි කියන සිද්ධිය

ඉන්දියානු ධීවරයින්ට වෙඩි තබන ලද්දේ යයි ද එක් ධීවරයෙකු ජීවිතක්ෂයට පත්වී තවත් ධීවරයෙකු තුවාල ලබන ලද්දේ යයි කියන සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය බලවත් කණගාටුවට පත් වේ.

ධීවරයින්ගේ ආරක්ෂාව විශේෂයෙන් වැදගත් වන හෙයින් ශ්‍රී ලංකා රජය සෑම කල්හිම සියලුම ඉන්දියානු ධීවරයින් සම්බන්ධයෙන් මානුෂීය ආකාරයකින්, සියලුම නියෝජිතායතන විසින් කටයුතු කරන බවට සහතික වෙයි.

ශ්‍රී ලංකා නාවික හමුදාව මෙම සිද්ධියට සම්බන්ධ නොමැති බව මූලික පරීක්ෂණ වලදී හෙළිදරව් වී තිබේ. අදාළ පාර්ශ්වකරුවන් කවරෙකු වුවද, වෙඩිතැබීමේ සිද්ධියක් ඇත්ත වශයෙන්ම සිදුවී ඇත්නම් එය දැඩි ලෙස සැලකිල්ලට භාජනය වන සිද්ධියක් ලෙස සලකනු ලබන අතර අදාළ ඉන්දියානු බලධාරීන්ගේ සහයෝගය ඇතිව, චන්ද්‍රිකා තාක්ෂණය ද උපයෝගී කර ගනිමින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමට හැකි සෑම පියවරක්ම ගනු ලැබේ.

විදේශ කටයුතු අමාත්‍යාංශය<br>
කොළඹ.

2017 මාර්තු 07 වෙනි දින.